පුදුකුඩිරුප්පු ප්‍රාදේශිය සභාව

මුලතිව් දිස්ත්‍රික්කය.

-----------------------------------

1. මූල්‍ය ප්‍රකාශ

---------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරිම.

---------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2013 අප්‍රේල් 02 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2012 අප්‍රේල් 10 දින ඉදිරිපත් කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 නොවැම්බර් 13 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 මතය

--------

මාගේ පරික්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරිම් අනුව පුදුකුඩිරුප්පු ප්‍රාදේශිය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශ වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට පුදුකුඩිරුප්පු ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදු සම්මත ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්විම්

------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

මූල්‍ය ප්‍රකාශයන්හි නිරික්ෂණය වූ ගිණුම්කරණ අඩුපාඩු ආදායම් සහ වගකීම් යටතේ විග්‍රහ කොට පහත වගුවෙහි දැක්වේ.

| මූල්‍ය ප්‍රකාශ කෙරෙහි බලපෑම | ආදායම | | වගකීම | |
|---|---|---|---|---|
| | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම |
| අඩුවෙන් දැක්වීම් | 3 | 3,059,649 | - | - |
| වැඩියෙන් දැක්වීම් | 2 | 146,700 | 2 | 1,906,611 |
| අත්හැරීම් | - | | 1 | 786,761 |

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම.

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරිම නිසා රු.27,086,938 ක් වටිනා ගනුදෙනු විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරිමට නොහැකි විය.

## 2. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය රු.7,490,686 ක් වූ අතර එයට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා වූ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය රු.43,933,815 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

අයවැය ලේඛණය සතුටුදායක ලෙස පිළියෙල කර නොතිබුණු බැවින් අයවැයගත සහ තථ්‍ය ආදායම සහ වියදම අතර පිළිවෙලින් රු.9,949,305 ක් සහ රු.4,323,639 ක් වූ වෙනස්කම් නිරික්ෂණය විය.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම

ලේකම්වරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි, සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.'000 | රු.'000 | රු.'000 |
| වරිපනම් සහ බදු | 12 | 5,361 | - |
| බදු කුලී | 19,073 | 591 | - |
| බලපත්‍ර ගාස්තු | 587 | 1,726 | - |
| වෙනත් ආදායම් | 11,249 | 13,294 | 8,148 |
| | 30,921 | 20,972 | 8,148 |

### 2.3.2 කඩ කුලී

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා වූ මුරිකන්ඩි කඩ 42 කින් අයවිය යුතු හිඟ කුලී රු.656,200 ක් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

### 2.3.3 උසාවි දඩ

සමාලෝචිත වර්ෂය සඳහා අයවිය යුතු රු.5,495,479 ක් වූ උසාවි දඩ ආදායම් ලැබිය යුතු මුදල් ලෙස ගිණුම්ගත කර තිබුණු නමුත් මෙම වාර්තාවේ දිනය දක්වා එම මුදල් අයකරගෙන නොතිබුණි.

2.3.4 මුද්දර ගාස්තු

--------------

(අ) රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් අයවිය යුතු මුද්දර ගාස්තු රු.101,200 ක් මෙම වාර්තාවේ දින දක්වා අයකරගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා අයවිය යුතු මුද්දර ගාස්තු පිළිබඳ ලැයිස්තුවක් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා ගෙන් ලබාගෙන නොතිබුණි.

2.4 වත්කම් කළමනාකරණය

-----------------------------

2.4.1 සමීක්ෂණ මණ්ඩල වාර්තා

------------------------------

සමීක්ෂණ මණ්ඩල වාර්තාවේ දැක්වෙන ප්‍රමාණයන් සහ තථ්‍ය තොග ප්‍රමාණයන් අතර අයිතම් 6ක අතිරික්තයන් හා ඌනතාවයන් අනාවරණය විය.

2.4.2 අත්තිකාරම්

-------------

(අ) 2008-2012 කාලය තුල සභා අරමුදලෙන් ලබාදෙන ලද රු.27,232,376 ක් වු අත්තිකාරම් මුදල් වර්ෂය අවසාන වනතෙක් පියවා නොතිබුණි.

(ආ) 2008 වර්ෂයේදි නිලධාරියෙකුට ගෙවන ලද රු.130,000 ක් වු වැටුප් අත්තිකාරමක් ආපසු අයකර ගෙන නොතිබුණි.

(ඇ) මුත්තායන්කට්ටු විවිධ සේවා සමූපකාර සමිතියට 2010 වර්ෂයේදි ලබා දෙන ලද රු.274,367 ක් වු අත්තිකාරම් මෙම වාර්තාවේ දිනය දක්වා නිරවුල් කර නොතිබුණි.

(ඇ) බර වාහන හිමිකරුවන්ගේ සමූපකාර සමිතියට 2010 වර්ෂයේදි ලබා දෙන ලද රු.20,000 ක් වු අත්තිකාරම් මෙම වාර්තාවේ දිනය දක්වා නිරවුල් කර නොතිබුණි.

2.4.3 කාර්ය මණ්ඩල ණය

------------------------

මියගිය/විශ්‍රාමලත් නිලධාරින්ගෙන් අයවිය යුතු රු.102,205 ක් වූ හිඟ ණය මුදල් පාරිතෝෂිකයෙන්/ඇපකරුවන්ගෙන් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

2.5 අනුකූල නොවීම්

-------------------

පහත සඳහන් නීති, රිති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදි නිරික්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| ------------------------------ | | -------------------------- |

(අ) ප්‍රාදේශීය සභා ( මූල්‍ය සහ පරිපාලන ) රීති - 1988

| | | | |
|---|---|---|---|
| (i) | II පරිච්ඡේදයේ 5 වගන්තියේ XII උප වගන්තිය | - | මුදල් සහ ගබඩා ආදිය පිළිබඳව කටයුතු කරනු ලබන නිලධාරින් ඇප තැන්පතු තැබුවේද යන්න සනාථ කර නොතිබුණි. |
| (ii) | III පරිච්ඡේදයේ 29 වගන්තිය | - | මුදල් වර්ෂය අවසානයේදි මුදල් පිළිබඳව කටයුතු කරන නිලධාරියා භාරයේ රු.1,394,806 ක මුදලක් පැවති අතර, එකතු වන මුදල් දිනපතා බැංකුගත නොකෙරෙන බව නිරික්ෂණය විය. |
| (iii) | III පරිච්ඡේදයේ 59 සහ 60 වගන්තිය | - | ව්‍යාපාර බදු පිළිබඳව සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (iv) | III පරිච්ඡේදයේ 65 වගන්තිය | - | ආදායම් නිලධාරියා විසින් ව්‍යාපාර බදු පැහැරහැරි අයගේ ලැයිස්තුවක් පිළියෙල කර ලේකම්වරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (v) | III පරිච්ඡේදයේ 66 වගන්තිය | - | 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 150(4) වගන්තිය ප්‍රකාරව රු.8,148,298 ක් වූ හිඟ මුදල් අයකර ගැනීමට ලේකම්වරයා කටයුතු කර නොතිබුණි. |
| (vi) | IV පරිච්ඡේදයේ 97 වගන්තිය | - | ගෙවීම් වවුචර් වල සඳහන් හඳුනාගැනීම් අංක සහ වියදම් විෂයයන් අයවැයෙහි සඳහන් ආකාරයට සටහන් කර නොතිබුණි. |
| (vii) | IV පරිච්ඡේදයේ 112 වගන්තිය | - | වැඩ නිම කිරිමේ සහතික ඉදිරිපත් කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (viii) | IV පරිච්ඡේදයේ 113 වගන්තිය | - | රඳවා ගැනීම් සම්බන්ධයෙන් පිරිවිතරයන්ට අනුව සතුටුදායක ලෙස වැඩ නිම කළ බවට සහතික ලබා ගෙන නොතිබුණි. |
| (ix) | V පරිච්ඡේදයේ 140 වගන්තිය | - | නියමිත දිනයන්හිදි රු.27,232,377 ක් වූ අත්තිකාරම් අයකර ගැනිම සඳහා ලේකම්වරයා විසින් කටයුතු කර නොතිබුණි. |

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ (උ) වගන්තියේ 132(ඒ) උප වගන්තිය - විෂයය භාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය නොමැතිව මොරටුව විශ්ව විද්‍යාලයේ දේශකවරුන් සහ සිසුන්ට සත්කාර කිරිම සඳහා රු.29,550 ක් වැයකර තිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි

-------------------

| | | | |
|---|---|---|---|
| (i) | අංක 1646 | - | සභාවේ වාහන පිළිබඳ දෛනික ධාවන වාර්තා සහ මාසික වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) | අංක 700 (V) වගන්තිය | - | ටෙන්ඩර් මණ්ඩලයේ නිර්දේශ සමග ප්‍රදානය කරනු ලැබූ ටෙන්ඩරයේ දෙවැනි පිටපත විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) | අංක 702 (03) වගන්තිය | - | ගිවිසුම්වල පිටපත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (iv) | අංක 571 | - | වර්ෂ 2 ඉක්ම වූ තැන්පතු රු.212,411 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

(ඈ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 9.3.1 - උප ග්‍රන්ථය 19 - රු.519,987 ක් වූ වාහන අළුත්වැඩියාවන් සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

2.6 කොන්ත්‍රාත් පරිපාලනය

2.6.1 ව්‍යපෘති ක්‍රියාත්මක කිරිමේ ප්‍රමාදයන්

මුදල් වර්ෂය අවසන් වීමට පෙර නිම කළ යුතු රු.348, 240 ක්වූ ව්‍යපෘති දෙකක් නිම නොකර විවිධ ණයගැති යන් වශයෙන් දක්වා තිබුණි.

2.6.2 සම්පූර්ණයෙන් අත්හැර දැමූ ව්‍යපෘති

සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තු කළ රු.මිලියන 4 ක් වූ ප්‍රාග්ධන ව්‍යපෘති ඉටුකර නොතිබුණු අතර රුම.මිලියන 6 ක් ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණි. මේ අනුව මහජනතාවට එම ව්‍යාපෘති මගින් ලබාගැනිමට අපේක්ෂිත ප්‍රතිලාභ ලැබි නොතිබුනු බව නිරීක්ෂණය විය.

2.7 මෙහෙයුම් අකාර්යක්ෂමතා

2010 වර්ෂයේදි ප්‍රජා මධ්‍යස්ථානය සඳහා පළාත් පාලන කොමසාරිස්වරයාගෙන් ලබාගත් රු.164,937 ක මුදල අපේක්ෂිත කාර්යය සඳහා යොදා නොගෙන විවිධ තැන්පතු ගිණුමෙහි රඳවාගෙන තිබුණි.

3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති සහ පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ආදායම් එකතු කිරිම
(ආ) ස්ථාවර වත්කම් පාලනය
(ඇ) ගිණුම්කරණය
(ඈ) කාර්ය මණ්ඩලය
(ඉ) පරිත්‍යාග
(ඊ) වාහන උපයෝජනය
(උ) විවිධ තැන්පතු
(ඌ) අයවැය ලේඛනය